ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

## පණිවිඩය

කුරුණෑගල මලියදේව විදුහල ජාතියට දායාද වී වසර 125 ක් සපිරෙයි. විදුහලේ ආදි විද්‍යාර්ථීන්ට සේම රටටම එය අභිමානය ගෙන දෙන්නේ ජාතිය වෙනුවෙන් මලියදේව විදුහල ඉටුකර ඇති අපරිමිත මෙහෙවර නිසා ය.

බෞද්ධ පුනර්ජවයේ ප්‍රතිඵලයක් ලෙස මලියදේව විදුහල ජාතියට දායාදවී තිබේ. ඒ ඕල්කොට්තුමා ඇතුළු දැ හිතකාමීන්ගේ අප්‍රතිහත ධෛර්යය සහ දැඩි අධිෂ්ඨානය නිසා ය. අධිරාජ්‍යවාදීන්ට එරෙහිව අවි ඔසවනවා වෙනුවට ඔවුන් ජාතියේ ගමන්මග ශක්තිමත් කිරීමට සම්බන්ධ කරගැනීමට එදා ගත් තීරණ අදත් ජාතියට යෝධ ශක්තියකි. කොළඹ ආනන්ද, ගාල්ල මහින්ද, නුවර ධර්මරාජ, කොළඹ මියුසියස් කාන්තා විදුහල ඇතුළු පාසල් අදත් ජාතිය හමුවේ විරාජමාන වන්නේ ද ඒ දූරදර්ශී වැඩ පිළිවෙල නිසා ය.

සත් කෝරළයේ පහන් ටැඹ ලෙස විරුදාවලී ලත් මලියදේව විදුහලේ අතීත ගමන්මග ඉතා සෞම්‍ය වූයේ නැත. දුෂ්කරතා හා අභියෝග මලියදේව විද්‍යාලයට බොහෝ විය. කුඩා බිම් කඩක සිසුන් 25 දෙනෙකුගෙන් ආරම්භ වූ විදුහල ප්‍රදේශයේ බෞද්ධ ජනතාවගේ, පරිත්‍යාගශීලීන්ගේ හා ප්‍රභූන්ගේ අධිෂ්ඨානයෙන් හා කැපවීමෙන් දියුණු විය. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම හා කුරුණෑගල තරුණ බෞද්ධ සමිතිය එදා විදුහලට තිබූ යෝධ ශක්තියකි.

මලියදේව විදුහල අද දිවයිනේ කීර්තිමත් පාසලකි. ඒ කීර්තිය වෙනුවෙන් කැප වූ ආදි වක්තෘන් බොහෝ ය. විදුහලේ ආරම්භක විදුහල්පතිවරයා වූ ටී. බී. මඩවල මහතා ඇතුළු සියල්ලෝම ජාතියේ ගෞරවයට නිතැතින්ම පාත්‍ර වෙයි.

මලියදේව විදුහලේ විද්‍යාර්ථීන් රටේ කීර්තියටත් අභිමානයටත් උර දී තිබේ. ත්‍රස්තවාදයෙන් රට නිදහස් කරගත් මානුෂීය මෙහෙයුම ඒ අතර එක් උදාහරණයකි. වෛද්‍යවරුන්, නීතිඥයන්, කලා කරුවන්, බුද්ධිමතුන් දෙස් විදෙස් හි රටත් මලියදේව නාමයත් රකිනා බව මම දනිමි. වර්තමාන සිසු දරුවන් ද ඒ ආදර්ශය පෙරටුකොට රටේත් ජාතියේත් මලියදේව විද්‍යාලයේත් අභිමානය වෙනුවෙන් පෙරට යනු දැක්ම අපගේ අපේක්ෂාව ය.

මලියදේව විදුහල් 125 වැනි සංවත්සර උළෙල සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා! යි පතමි.

මහින්ද රාජපක්ෂ

2013 මැයි මස 28 වෙනි දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

Scanned with CamScanner